# පරීක්ෂක වාර්තාව

AA2 විභාගය - ජුලි 2019

## (AA21) උසස් මූල්‍ය ගිණුම්කරණය
(Advanced Financial Accounting)

---

## A - කොටස

(වාස්තවික පරීක්ෂණ ප්‍රශ්න)
(ලකුණු 20)

### ප්‍රශ්න අංක 01

මෙය ලකුණු 20 ක අනිවාර්ය ප්‍රශ්නයකි. උසස් මූල්‍ය ගිණුම්කරණය විෂය නිර්දේශය ආවරණය කරමින් දැනුම පරීක්ෂා කර තිබේ. අයදුම්කරුවන් සුළු පිරිසක් පමණක් මෙම ප්‍රශ්නයට සම්පූර්ණ ලකුණු ලබාගෙන තිබුණි.

(1.1) තොගයක ශුද්ධ උපලබ්ධි අගය ගණනය කිරීම පිළිබඳ අයදුම්කරුවන්ගේ දැනුම පරීක්ෂා කර ඇත. අයදුම්කරුවන් බොහොමයක් නිවැරදි ලෙස උත්තර ලියා තිබුණේය. සමහර අයදුම්කරුවන් යල්පැනගිය තොග විකිණීමේදී දරණ ලද විකුණුම් කොමිස් අඩුකර තිබුණේ නැත.

(1.2) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිත-02 පිළිබඳ දැනුම පරීක්ෂා කල ප්‍රශ්නයකි. අයදුම්කරුවන්ගෙන් බහුතරය නිවැරදිව උත්තර ලියා තිබුණේය.

(1.3) 1890 හවුල් ව්‍යාපාර ආඥා පනතේ 24 වන වගන්තිය පිළිබඳව පරීක්ෂා කර තිබූ අතර, අයදුම්කරුවන්ගෙන් බහුතරය නිවැරදි ලෙස උත්තර සපයා ඇත.

(1.4) දේපළ, පිරියත සහ උපකරණවල සරල මාර්ගික පදනම මත ක්ෂය සහ ධාරණ අගය ගණනය කිරීම මෙම ප්‍රශ්නය මඟින් පරීක්ෂා කර තිබුණි. අයදුම්කරුවන්ගේ උත්තර සතුටුදායක වූ නමුත් ඇතැම් අයදුම්කරුවන් ප්‍රශ්නයේ දී තිබූ අවශේෂ වටිනාකම අඩුකර තිබුණේ නැත.

(1.5) මූල්‍ය ප්‍රකාශනවල ප්‍රතිපාදනයක් හඳුනා ගැනීමට සපුරාලිය යුතු නිර්ණායක ගැන ප්‍රශ්නයෙන් විමසා තිබූ අතර, අයදුම්කරුවන් බොහොමයකට වෙන්කර තිබූ මුළු ලකුණු උපුටාගත හැකි නොවීය.

(1.6) දී තිබූ තොරතුරු මත පදනම්ව වර්ෂයට අදාල විකුණුම් ගණනය කරන්නේ කෙසේදැයි ප්‍රශ්නයෙන් පරීක්ෂා කර ඇත. දී තිබූ තොරතුරු නිසි ලෙස අවබෝධ කර නොගැනීමෙන් සමහර අයදුම්කරුවන් වැරදි උත්තර සපයා තිබුණේය. දළ ලාභය විකුණුම්වලින් 20% ක් ලෙස ප්‍රශ්නයේ පැහැදිලිව දී තිබූ නමුත් සමහරු එය විකුණුම් පිරිවැයෙන් 20% ක් ලෙස සළකා තිබුණි.

(1.7) හවුල් ව්‍යාපාරයක කැප කිරීමේ අනුපාතය ගණනය කරනු ලබන්නේ කෙසේදැයි ප්‍රශ්නයෙන් පරීක්ෂා කර තිබූ අතර, සමහර අයදුම්කරුවන් එය නිසි ලෙස ගණනය කර තිබුණේ නැත. තවද, ඇතැම් අයදුම්කරුවන් කැපකිරීමේ අනුපාතය ගණනය කල ආකාරය නොපෙන්වා උත්තර සපයා තිබුණි.

(1.8) ගැනුම් / විකුණුම් මත එකතු කල අගය මත බදු ගණනය කිරීම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර තිබූ අතර, එය ප්‍රායෝගික ප්‍රශ්නයක් විය. අයදුම්කරුවන්ගේ ප්‍රායෝගික දැනුම ඉතාමත් දුර්වල බව පෙනී ගිය අතර, ඇතැම් අය එකතුකල අගය මත බදු පාලන ගිණුමේ නිවැරදි පැත්තේ සටහන් තබා නොතිබුණි. අත්පිට මුදලට මිලදී ගැනීම් දී තිබුනේ එකතුකල අගය මත බදු ඇතුලත්වය. එහෙත් බහුතරය ඒ ගැන සළකා නොතිබුණේය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## B කොටස

(එකකට ලකුණු 5 බැගින් අනිවාර්ය ප්‍රශ්න 5 කි)

(මුළු ලකුණු 25)

### ප්‍රශ්න අංක 02

මෙම ප්‍රශ්නයෙන් ණයහිමි පාලන ගිණුම පිළිබඳව පරීක්ෂා කර ඇති අතර, අයදුම්කරුවන් ඉතා සුළු පිරිසක් ප්‍රශ්නයට නිවැරදි උත්තර සපයා තිබුණි. සමහර අයදුම්කරුවන් සැසඳුම්කරණයේදී අඩු කරනවා වෙනුවට සටහන් (entries) එකතු කර තිබෙනු දක්නට ලැබුණි. ලද වට්ටම්, පාලන ගිණුමේ සටහන් කර තිබූ නමුත්, සමහර අයදුම්කරුවන් පාලන ගිණුමේ නැවතත් එය ඇතුලත් කර තිබූ අතර, අයදුම්කරුවන් ටික දෙනෙකු ලද වට්ටම් බැර සටහන් ලෙසද ඇතුලත් කර තිබුණි. පාලන ගිණුමේ ගැලපිය යුත්තේ කුමන සටහන්දැයි අයදුම්කරුවන් වටහාගෙන තිබුණේ නැත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොවීය.**

### ප්‍රශ්න අංක 03

හවුල් ව්‍යාපාරවල ලාභ හෝ පාඩු විසර්ජන ගිණුම් පිළියෙල කිරීම පිළිබඳ දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර තිබූ අතර, න්‍යායාත්මක පැතිකඩ පිළිබඳ දැනුම නොමැති කමින් සමහර අයදුම්කරුවන් ගැනිලි, විසර්ජන ගිණුමේ පෙන්වා තිබුණේය. තවද, අයදුම්කරුවන් කිප දෙනෙකු ප්‍රශ්නයේ විමසා නොතිබූ හවුල්කරුවන්ගේ ජංගම ගිණුම් ද පිළියෙල කර තිබුණේය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

### ප්‍රශ්න අංක 04

ප්‍රාග්ධන වියදම් පිළිබඳව දැනුම සහ දරණ ලද පිරිවැය ප්‍රාග්ධනිත කරනු ලබන්නේ කෙසේද යන්න පිළිබඳ දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර ඇත. අයදුම්කරුවන් බොහොමයක් රු.10,000/- ක් වූ යන්ත්‍රය පරීක්ෂා කිරීම සඳහා සිදුකළ නිෂ්පාදිත නියැදියේ පිරිවැය ප්‍රාග්ධනිත කර තිබුණේ නැත. බහුතරය විසින් අනෙකුත් අයිතම ප්‍රාග්ධන වියදම් ලෙස සළකා තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

### ප්‍රශ්න අංක 05

බැංකු සැසඳුම සහ මුදල් පාලන ගිණුම පිළිබඳ දැනුම පරීක්ෂා කරන ලදි. අයදුම්කරුවන්ගෙන් බොහෝ දෙනෙකු මුදල් පාලන ගිණුමට සම්බන්ධ සටහන් නිවැරදිව හඳුනාගෙන තිබුණේ නැත. සමහර අයදුම්කරුවන් දී තිබූ ගැලපීම් කිරීමට පෙර, වැරදි ආකාරයට මුදල් පාලන ගිණුමේ පෙන්නුම් කර තිබූ සත්‍ය බැංකු ශේෂය ගණනය කර තිබුණේය. බැංකු සැසඳුමේ වැරදි ලෙස සඳහන් කර තිබූ නමුත් චෙක්පත් අංක 150162 හි නිවැරදි ගණන මුදල් පොතේ සටහන් කර තිබුණි. බහුතරය විසින් එය තේරුම්ගෙන තිබුණේ නැත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොවීය.**

### ප්‍රශ්න අංක 06

සාමාජික දායක මුදල් ගිණුම් පිළිබඳ දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර තිබේ. ආදායම් ප්‍රකාශනයට මාරු කළ යුතු වර්ෂය සඳහා නිවැරදි සාමාජික දායක මුදල ගණනය කිරීමට සමහර අයදුම්කරුවන් සමත් වී නැත. තවද එක් සාමාජිකයෙකුගේ වර්ෂ 3 ක සාමාජික මුදල බොල් ණයක් ලෙස සළකා කපා හැරීම, සමහර අයදුම්කරුවන් විසින් නොසළකා ඇත.

හිඟව ඇති සාමාජික මුදල් බැරට සටහන් කිරීම වැනි වැරදි සටහන් සමහර අයදුම්කරුවන් විසින් සාමාජික දායක මුදල් ගිණුමේ සටහන් කර තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## C කොටස

(එකකට ලකුණු 10 බැගින් අනිවාර්ය ප්‍රශ්න 3 කි)
(මුළු ලකුණු 30)

### ප්‍රශ්න අංක 07

අස්තිත්වයක මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීම පිළිබඳ දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර ඇත. හිමිකරුගේ පුද්ගලික වෑන් රථය ව්‍යාපාරයට මාරු කිරීම නිසි ලෙස සටහන් නොකළ අයදුම්කරුවන් කිපදෙනෙකු විය. තවද වර්ෂ අවසානයට වෙළෙඳ ලැබිය යුතු මුදල් ශේෂයෙන් බුන්වත්භාවයට පත් ණයගැතියාගෙන් අයවිය යුතුව තිබූ රු.75,000/- ශේෂය අඩුකිරීමෙන් පසු, ප්‍රතිපාදනය ගණනය කිරීම නොකළ අයදුම්කරුවන් කිපදෙනෙකුද විය. දී ඇති ශුද්ධ ලාභයෙන් එම ගැලපුම් අඩුකළ යුතු බව සමහර අයදුම්කරුවන් තේරුම්ගෙන තිබුණේ නැත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

### ප්‍රශ්න අංක 08

ලාභ සඳහා නොවන සංවිධානයක ආදායම් සහ වියදම් ගිණුම පිළියෙල කිරීම පිළිබඳ දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර ඇත.

බොහොමයක් අයදුම්කරුවන් වර්ෂයට අදාල සාමාජික ගාස්තු ගණනය කර නොතිබූ අතර, සමහර අයදුම්කරුවන් ලැබීම් සහ ගෙවීම් ගිණුමේ පෙන්වා තිබූ සියලුම ලැබීම් සහ ගෙවීම් ආදායම් සහ වියදම් ගිණුමට ගෙන තිබුණි. සමහර අයදුම්කරුවන් පිරිවැය වෙනුවට 2018 ජනවාරි 31 දිනට ගොඩනැගිල්ලේ ධාරණ අගය මත ක්ෂය ගණනය කර තිබුණේය. අයදුම්කරුවන් කිපදෙනෙකු විසින් හිඟ සාමාජික මුදල්වල ආරම්භක සහ අවසාන ශේෂ නිවැරදි ලෙස සැලකිල්ලට ගෙන තිබුණේ නැත.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

### ප්‍රශ්න අංක 09

හවුල් ව්‍යාපාර පිළිබඳ මූලික දැනුම මෙම ප්‍රශ්නයෙන් පරීක්ෂා කර තිබූ අතර, හවුල්කරුවන්ගේ ප්‍රාග්ධන සහ ජංගම ගිණුම් පිළියෙල කිරීමද අවශ්‍ය කර තිබුණි.

ප්‍රාග්ධන ගිණුම් හරහා කීර්තිනාම ගැලපීම කළ යුතුයැයි පැහැදිලි උපදෙස් දී තිබුණද අයදුම්කරුවන් කිපදෙනෙකු එම උපදෙස් පිළි නොපැද ජංගම ගිණුම හරහා එම ගැලපීම කර තිබූ බැව් දක්නට ලැබුණි.

ප්‍රශ්නයේ දී තිබූ පරිදි **රතිල්** ව්‍යාපාරයෙන් විශ්‍රාම ගැනීමට තීරණය කර තිබූ නිසා ඔහු විශ්‍රාම ගැනීමෙන් පසු ගෙවිය යුතු මුළු මුදල් ණය ගිණුමකට මාරු කළ යුතුව තිබුණි. කෙසේවෙතත්, සමහර අයදුම්කරුවන් එම උපදෙස් පිළිපැද තිබුණේ නැත.

සමහරු **සුනිල්ගේ** රු.30,000/- ක මාසික වැටුප වාර්ෂික වැටුපක් ලෙස සළකා තිබුණේය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

## D කොටස

(අනිවාර්ය ප්‍රශ්නයකි)

(ලකුණු 25)

**ප්‍රශ්න අංක 10**

සීමාසහිත පෞද්ගලික සමාගමක කළමනාකාරිත්වයේ භාවිතය සඳහා විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය පිළියෙල කිරීම මෙම ප්‍රශ්නයෙන් අපේක්ෂා කර තිබේ.

නිරීක්ෂණය වූ පොදු වැරදි කිපයක් පහත සඳහන් පරිදි වේ:

(1) සමහර අයදුම්කරුවන් විසින් කාලපරිච්ඡේදය සඳහා ගෙවිය යුතු ණයකර පොලී නිවැරදි ලෙස ගණනය කර නොතිබුණි.

(2) අයදුම්කරුවන්ගෙන් බහුතරයක් විසින් ආදායම් බදු ගැලපීම් සිදුකළ ආකාරය කටුවැඩවලින් පෙන්වා නොතිබූ අතර, අදාල වර්ෂය සඳහා ගෙවිය යුතු නිවැරදි බදු ප්‍රමාණය ගණනය කිරීමද කර තිබුණේ නැත.

(3) සමහර අයදුම්කරුවන් විසින් වර්ෂය සඳහා ආදායම් බදු, මූල්‍ය වියදම් ශීර්ෂය යටතේ වැරදි ආකාරයට පෙන්වා තිබුණේය.

(4) ඇතැම් අයදුම්කරුවන් පරිපාලන වියදම් සහ බෙදාහැරීමේ වියදම්වල සවිස්තර ගණනය කිරීම් ආදිය අමුණා නොතිබීමේ හේතුව නිසා යම් ලකුණු ගණනක් ඉපැයීමට අපොහොසත් විය.

(5) සමහර අයදුම්කරුවන් වැඩ පත්‍රිකාවල වත්කම් මත ක්ෂය ගණනය කර තිබුණද, මූල්‍ය ප්‍රකාශනවල නිවැරදි තැන්වල ඒවා සටහන් කර තිබුණේ නැත.

(6) සමහර අයදුම්කරුවන් උපචිත දැ සහ කලින් ගෙවීම් මූල්‍ය ප්‍රකාශනවල නිසිපරිදි පෙන්වා තිබුණේ නැත.

(7) ඇතැම් අයදුම්කරුවන් ආදායම් ප්‍රකාශන සහ මූල්‍ය තත්ත්ව ප්‍රකාශන සඳහා පොදුවේ පිළිගෙන ඇති ආකෘති රටාව පිළිපැද තිබුණේ නැත.

(8) සමහර අයදුම්කරුවන් ඇතැම් සංඛ්‍යා දහස් ගණනින්ද ඇතැම් සංඛ්‍යා දහස් ගණන්වලට ආසන්නතම කරවීමෙන් තොරවද භාවිත කර තිබුණි. එබැවින් සටහන් කරන ලද ප්‍රමාණ සාවද්‍යවීමේ හේතුවෙන් ඔවුන් මුළු ලකුණු ඉපැයීමට අපොහොසත් වී තිබුනි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

\- - -

**අයදුම්කරුවන්ගේ තේරුම් ගැනීම දියුණු කිරීමේදී සැළකිල්ලට ගත යුතු සාමාන්‍ය කරුණු:**

1. විෂය නිර්දේශයේ සම්පූර්ණ කරුණු හොඳින් අධ්‍යයනය කිරීම සහ සෑම ඒකකයකින්ම හෝ අංශයකින්ම අපේක්ෂිත දැනුම් මට්ටම පිළිබඳ මනා අවබෝධයක් ඇතිකර ගැනීම.

2. අයදුම්කරුවන් විසින් ප්‍රශ්නය කිහිපවතාවක්ම හොඳින් කියවිය යුතු අතර, සියලුම ගණනය කිරීම්වලට අදාළ පෙරවැඩ පැහැදිලිව පෙන්වා දැක්විය යුතුය.

3. උත්තර සැපයීමේදී උපකල්පනයන් අදාළ වන්නේ නම්, එම උපකල්පනයන් පැහැදිලිව දැක්විය යුතුය.

4. අත් අකුරු පැහැදිලි විය යුතු අතර ප්‍රශ්න අංකයන් නිවැරදිව දැක්විය යුතුය. පිළිතුරු පත්‍රය භාරදීමට පෙර ප්‍රශ්න අංක නැවත පරීක්ෂා කිරීම ආදී දේ අනිවාර්ය වේ.

5. ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව අනුගමනය කළ යුතුය.

6. අවබෝධය, කුසලතා සහ පළපුරුද්ද තියුණු කර ගැනීම සඳහා පසුගිය ප්‍රශ්න පත්‍ර සහ යෝජිත පිළිතුරු උපකාරීවනු ඇත. සමාන රටාවන් සහ ව්‍යූහයන් නැවතත් ප්‍රශ්න පත්‍රයන් තුළ ඇතුළත් විය හැකි බැවින් එය සෑම විටම වාසිදායක වනු ඇත.

7. මෙම විෂයට අදාළව ගිණුම්කරණ ප්‍රමිත, ස්ව-අධ්‍යාන පොත සහ සඟරා මෙන්ම අදාළ විෂය කොටස් සඳහා අදාළවන අනෙකුත් කියවීම් පරිශීලනය කිරීම සිදු කරන්න.

8. කාල කළමනාකරණය විභාගයේදී ඉතා වැදගත් වේ. සෑම ප්‍රශ්නයකටම වෙන් කර ඇති ලකුණු දෙස බැලීමෙන්, පිළිතුරු සැපයීමට වැය කළ යුතු කාලය පිළිබඳ ඇස්තමේන්තුවක් කළ හැකිය.

9. විභාගය සමත්වීමට තිර අදිටනින් යුතුව, මනා සූදානමකින් විභාගයට පෙනී සිටීම සිදු කරන්න.

- * * * -